# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත සංශෝධනය කිරීමේ 1991 අංක 9 දරන පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 මාර්තු මස 8 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

## 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත සංශෝධනය කිරීමේ 1991 අංක 9 දරන පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 61/89

### 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත සංශෝධනය කිරීමේ 1991 අංක 9 දරන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ 1 වන වගන්තිය, එහි " යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේය " යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1988 අංක 79 දරන පනතේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම.

" යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේය. මේ පනතේ වෙනස් වෙනස් විධිවිධාන සම්බන්ධයෙන් වෙනස් වෙනස් දින යන් නියම කරනු ලැබිය හැකිය. ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" උත්තරවාද සංශෝධනය කිරීම.

93. (1) නඩුව විභාග කිරීම සඳහා පළමුවෙන් නියම කරන ලද දිනයට ප්‍රථම අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත නඩුවේ සියලු පාර්ශ්ව කරුවන් ඉදිරිපිට දී හෝ සියලු පාර්ශ්වකරුවන්ට සාධාරණ කාලයක දැනුම්දීමකින් පසු, නඩුවේ සියලු උත්තරවාද, ඒවාට යමක් එකතු කිරීමෙන් හෝ ඒවා වෙනස් කිරීමෙන් හෝ ඒවායේ යමක් අත්හැරීමෙන් හෝ ස්වකීය අභිමතය පරිදි සංශෝධනය කිරීමට, අධිකරණයට බලය ඇත්තේ ය.

(2) යම් උත්තරවාදයක් සංශෝධනය කිරීම සඳහා ඉඩ නොදුනහොත් බරපතල වූ ද ප්‍රතිකර්ම යෙදිය නොහැකි වූ ද අයුක්තියක් සිදුවිය හැකි බවට සහ ඉල්ලුම්කාර පාර්ශ්වකරුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරවා ගැනීමෙහි ලා අනවශ්‍ය ප්‍රමාදයක් සිදු වී නොමැති බවට අධිකරණය විසින් වාර්තා ගත කළ යුතු හේතු නිසා අධිකරණය සෑහී

මට පත්වන්නේ නම් මිස නඩුව විභාග කිරීම සඳහා පළමුවෙන් නියම කරන ලද දිනයේදී හෝ ඉන් පසුව සහ අවසාන තීන්දුවට පෙර උත්තර වාද සංශෝධනය සඳහා වූ කිසිම ඉල්ලීමකට, වෙනත් කිසිම හේතුවක් මත ඉඩ නොදිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි උත්තර වාද සංශෝධනය සඳහා වූ යම් ඉල්ලීමක් සුදුසු යැයි අධිකරණය කල්පනා කරන පරිදි, නඩු ගාස්තු සහ නඩුව කල් තැබීම පිළිබඳව සහ වෙනත් කරුණු පිළිබඳව අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි යම් නියමයන් මත විය යුතු ය.

(4) උත්තරවාදවල කරන එකතු කිරීම් හෝ වෙනස් කිරීම් හෝ අත්හැරීම්, ආඥාව බලපාන්නා වූ උත්තරවාදය මත පැහැදිලිව කළ යුතු ය; නැතහොත් එය පහසුවෙන් කරනු ලැබිය නොහැකි නම්, වෙනස් කරන ලද පරිදි වූ උත්තරවාදයේ පැහැදිලි පිටපතක් නඩුවේ වාර්තාවෙහි සංශෝධනය කරන උත්තරවාදයට ඇමිණිය යුතු ය. ඒ සෑම එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ අත්හැරීමක්ම විනිශ්චයකාරවරයා විසින් අත්සන් කළ යුතු ය.'.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.